**ශීර්ෂය 254 - රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව පිළිබඳ විගණකාධිපති වාර්තාව 2015 වර්ෂය**

---

ශීර්ෂය 254 - රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම, ආදායම් ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2016 ජූනි 29 දින දෙපාර්තමේන්තුවේ රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

## 1.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

---

විසර්ජන ගිණුම, ආදායම් ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149,150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම හා පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

## 2. ගිණුම්

---

### 2.1 විසර්ජන ගිණුම

---

#### (අ) මුළු ප්‍රතිපාදනය හා වියදම

---

දෙපාර්තමේන්තුව සඳහා සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.මිලියන 1,325.20 ක්වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු. මිලියන 1,272.04 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු. මිලියන 53.16 ක් හෙවත් සියයට 4.01 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| වියදම | 2015 දෙසැම්බර් 31 දිනට | | | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | |
| | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | |
| පුනරාවර්තන | 1,261.20 | 1,217.45 | 43.75 | 3.47 |
| මූලධන | 64.00 | 54.59 | 9.41 | 14.70 |
| **එකතුව** | **1,325.20** | **1,272.04** | **53.16** | **4.01** |

(ආ) **වෙනත් අමාත්‍යාංශයක් විසින් ලබා දුන් ප්‍රතිපාදන උපයෝජනය**

හිමිකම් ලියාපදිංචි කිරීමේ වැඩසටහන සඳහා දෙපාර්තමේන්තුව වෙත ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය විසින් රු.මිලියන 18.0 ක ප්‍රතිපාදන සලසා තිබුණු අතර, සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු.මිලියන 14.2 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව සලසා තිබුණු ප්‍රතිපාදනවලින් රු.මිලියන 3.8 ක් හෙවත් සියයට 21 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි.

## 2.2 ආදායම් ගිණුම්

දෙපාර්තමේන්තුව විසින් 2015 වර්ෂය සඳහා ආදායම් සංකේත අංක 02 ක් සඳහා එකතුව රු.මිලියන 1,425.0 ක ආදායම් ඇස්තමේන්තු කර තිබුණු අතර සමාලෝචිත වර්ෂයේදී එකතුව රු.මිලියන 1,143.0 ක ආදායම් රැස්කර තිබුණි. එය ඇස්තමේන්තුගත ආදායමෙන් සියයට 80 ක් වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| **ආදායම් සංකේතය** | **2015 දෙසැම්බර් 31 දිනට** | | | **ඌනතාවය ඇස්තමේන්තුවේ ප්‍රතිශතයක් ලෙස** |
|---|---|---|---|---|
| | **ඇස්තමේන්තුගත ආදායම** | **තථ්‍ය ආදායම** | **ඌනතාවය** | |
| | **රු.මිලියන** | **රු.මිලියන** | **රු.මිලියන** | |
| 10:03:07:02 | 1,400.00 | 1,129.03 | 270.98 | 19.36 |
| 10:03:08:00 | 25.00 | 14.44 | 10.56 | 42.24 |
| එකතුව | **1,425.00** | **1,143.47** | **281.54** | **19.76** |

## 2.3 අත්තිකාරම් ගිණුම්

### 2.3.1 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

දෙපාර්තමේන්තුවට අදාල විෂය අංක 25401 යටතේ රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| **වියදම** | | **ලැබීම්** | | **හර ශේෂය** | |
|---|---|---|---|---|---|
| **උපරිම සීමාව** | **තථ්‍ය** | **අවම සීමාව** | **තථ්‍ය** | **උපරිම සීමාව** | **තථ්‍ය** |
| **රු.මිලියන** | **රු.මිලියන** | **රු.මිලියන** | **රු.මිලියන** | **රු.මිලියන** | **රු.මිලියන** |
| 70.00 | 58.71 | 40.00 | 54.95 | 230.00 | 176.81 |

## 2.4 අග්‍රිම ගිණුම

---------------

දෙපාර්තමේන්තුව යටතේ වූ අංක 7002/0000/00/0114/0015/000 දරන අග්‍රිම ගිණුමෙහි 2015 දෙසැම්බර් 31 දිනට ශේෂය රු.මිලියන 11.74 ක් විය.

## 2.5 පොදු තැන්පත් ගිණුම්

-------------------------

දෙපාර්තමේන්තුව යටතේ වූ පොදු තැන්පත් ගිණුම් 02 ක 2015 දෙසැම්බර් 31 දිනට ශේෂ එකතුව රු. මිලියන 0.288 ක් විය. විස්තර පහත දැක්වේ.

| **තැන්පත් ගිණුම් අංකය** | **2015 දෙසැම්බර් 31 දිනට ශේෂය** |
|---|---|
| | **රු. මිලියන** |
| 0000/0000/00/0001/0107/000 | 0.275 |
| 0000/0000/00/0018/0099/000 | 0.013 |
| | **0.288** |

## 2.6 විගණන නිරීක්ෂණය

------------------------

රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විසර්ජන ගිණුම, ආදායම් ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන ඉහත 1.1 ඡේදයේ දක්වා ඇති කළමනාකරණ විගණන වාර්තාවේ සඳහන් විගණන නිරීක්ෂණවලට යටත්ව සතුටුදායක ලෙස පිළියෙල කර තිබුණි. එම කළමනාකරණ විගණන වාර්තාවේ ඇතුළත් විගණන නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ 3 ඡේදයේ සඳහන් කර ඇත.

## 3. ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ

-------------------------------------------------

## 3.1 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

----------------------------------------------

දෙපාර්තමේන්තුව විසින් පහත දැක්වෙන ලේඛන පවත්වා නොතිබුණු අතර, නිවාඩු පිළිබඳ ලේඛනය යාවත්කාලින කර නොතිබුණු බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| | **ලේඛන වර්ගය** | **අදාල රෙගුලාසිය** |
|---|---|---|
| (අ) | ස්ථාවර වත්කම් ලේඛනය | 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය |
| (ආ) | දෙපාර්තමේන්තු විසර්ජන (සම්මත) වැය ලෙජරය | මුදල් රෙගුලාසි 447 හි සඳහන් විධිවිධාන ඇතුළත් වන පරිදි 138 වැනි පොදු පෝරමය |
| (ඇ) | රාජකාරි දුරකථන ලේඛනය | මුදල් රෙගුලාසි 845 (1) ප්‍රකාර 26 වැනි පරිශිෂ්ඨය |

| | | |
|---|---|---|
| (ඈ) | ඇප ලේඛනය | මුදල් රෙගුලාසි 891 (1) |
| (ඉ) | ඉන්ධන හා ලිහිසි තෙල් තොග පොත | මුදල් රෙගුලාසි 1647 (ඈ) |
| (ඊ) | ප්‍රසම්පාදන කමිටුවේ හා තාක්ෂණ ඇගයීම් කමිටුවල පැමිණීමේ ලේඛනය | 2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.11.2 මාර්ගෝපදේශය |

**3.2 විගණන සාක්ෂි නොවීම**

මුදල් රෙගුලාසි 272 (2) ප්‍රකාරව කටයුතු නිම නොකළ එකතුව රු.98,477,281 ක් වටිනා ගෙවීම් වවුචර් 112 ක් අස්ථානගත වී තිබූ අතර එම ගෙවීම්වල ස්වභාවය පිළිබඳ විස්තර හා ගෙවීම තහවුරු කෙරෙන සාක්ෂි පිළිබඳව විගණකාධිපති වෙත පිටපත් සහිතව භාණ්ඩාගාරය වෙත දැනුම් දී නොතිබුණි.

**3.3 විසර්ජන ගිණුම**

**අයවැය විචලනය**

වැය විෂයයන් 18 ක් සඳහා අධි ප්‍රතිපාදන සලසා තිබීම හේතුවෙන් ප්‍රතිපාදන උපයෝජනය කිරීමෙන් පසු ඉතිරිය එම වැය විෂයයන්ට අදාළ ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 12.67 ක සිට සියයට 87.64 ක් දක්වා පරාසයක ප්‍රමාණයක් වී තිබුණි.

**3.4 ආදායම් ගිණුම්**

දෙපාර්තමේන්තු ප්‍රධානියා ආදායම් ගණන්දීමේ නිලධාරියා වශයෙන් ආදායම් සංකේත 02 ක ආදායම් ඇස්තමේන්තු පිළියෙල කිරීම, ආදායම් රැස්කිරීම, ගිණුම්ගත කිරීම හා ගිණුම් ඉදිරිපත් කිරීමේ කාර්යභාරයන් පැවැරි තිබුණි. එම ආදායම් සංකේතවලට අදාළව සිදු කළ නියැදි විගණනයේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

**(අ) 10:03:07:02 දරන ආදායම් සංකේතය - ලියාපදිංචි කිරීමේ ගාස්තු ආදායම් ගිණුම.**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) වාර්ෂික අයවැය ඇස්තමේන්තුව අනුව ආදායම් සංකේතයට ආදාලව රු.මිලියන 1,400 ක ආදායමක් රැස්කිරීමට ඇස්තමේන්තු කර තිබුණි. සමාලෝචිත වර්ෂය අවසානයට රු.මිලියන 1,129 ක් රැස්කර තිබුණි. එය ඇස්තමේන්තුගත ආදායමෙන් සියයට 80 ක් වී තිබුණි. අපේක්ෂිත ආදායම් ඉලක්ක ළඟා කර ගැනීමට නොහැකි වීම සම්බන්ධයෙන් දෙපාර්තමේන්තුව විසින් සංශෝධිත ආදායම් ඇස්තමේන්තු පිළියෙල කර රාජ්‍ය මුල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර නොතිබුණි.

(ii) විගණනයට ඉදිරිපත් කර සහතික කරන ලද ආදායම් ගිණුම අනුව එකතුව රු.7,975,807 ක ආදායම් හිඟහිට තිබුණු අතර, ඒ පිළිබඳ කාල විශ්ලේෂණයක් ඉදිරිපත් කර නොතිබුණි.

(iii) මුදල් රෙගුලාසි 128(2) ප්‍රකාරව ආදායම් සංකේතයට අදාළ අර්ධ වාර්ෂික හිඟ ආදායම් පිළිබඳ වාර්තා පිළියෙල කර නොතිබුණි.

(iv) ඉකුත් වර්ෂයේ රු.6,519,632 ක් වූ හිඟ ආදායම් ඒ ආකාරයෙන්ම සමාලෝචිත වර්ෂයේදීත් හිඟ ආදායම් ලෙස දක්වා තිබූ අතර සමාලෝචිත වර්ෂයේදී අයකළ හා කපාහැරි රු.4,995,624 ක් වූ මුළු වටිනාකම කුමන වර්ෂයන්ට අදාළව ද යන්න හඳුනාගැනීමට නොහැකි වී තිබුණි. ඒ ඒ වර්ෂයන් වෙනුවෙන් අයවිය යුතු හිඟ මුදල් වෙන්ව හඳුනාගත හැකි අයුරින් ක්‍රමවත් වාර්තා පවත්වා නොතිබීම එයට හේතුවී තිබුණි.

(v) ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලවල හිඟ මුදල් හා දඩ මුදල් පළාත් පාලන ආයතනවලට අයත් ආදායමක් වූවද, සමාලෝචිත වර්ෂය තුළ පනවන ලද හිඟ සහ දඩ මුදල් රු.4,177,921 කින්, අයකළ හා කපාහැරි රු.3,568,286 ක් ගැලපීමෙන් පසුව ඉතිරි වූ රු.609,635 ක් සමාලෝචිත වර්ෂයේ ලැබිය යුතු හිඟ ආදායම් ශේෂයට ඇතුළත් කර තිබුණි.

(vi) ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලවලින් සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලින් මාසික වාර්තා නියමිත පරිදි ගෙන්වා නොගැනීම නිසා සමාලෝචිත වර්ෂයේ රැස්කර තිබූ රු 1,154,990,220.ක් වූ දළ ආදායමේ නිවැරදිතාවය සනාථ කර ගැනීමට නොහැකි වී තිබුණි.

**(ආ) 10:03:08:00 දරන ආදායම් සංකේතය - නොතාරිස්වරුන්ට වාර්ෂික මහාධිකරණ සහතික නිකුත් කිරීමේ ගාස්තු ආදායම**

**----------------------------------------------------------------------------------------------**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) තාත්ත්වික ආකාරයට ආදායම් ඇස්තමේන්තු පුරෝකථනය කර ආදායම් ඉලක්ක සපුරා ගැනීමට කටයුතු කර නොතිබූ අතර ඉකුත් වර්ෂයේ රු.මිලියන 17.6 ක් වූ ශුද්ධ ආදායම හා 12,243 ක් වූ ලියාපදිංචි වී සිටි නොතාරිස් සංඛ්‍යාව පිළිබඳව සැළකිල්ලට නොගෙන සමාලෝචිත වර්ෂයේ රු.මිලියන 10 ක මූලික ආදායම් ඇස්තමේන්තුවක් දෙපාර්තමේන්තුව විසින් සකස් කර තිබුණි. කෙසේ වුවද, භාණ්ඩාගාරය විසින් ආදායම් ඇස්තමේන්තුව රු.මිලියන 25.0 ක් දක්වා පසුව සංශෝධනය කර තිබුණි.

(ii) වාර්ෂික අයවැය ඇස්තමේන්තුව අනුව ආදායම් සංකේතයට ආදාලව රු.මිලියන 25.0 ක ආදායමක් රැස්කිරිමට ඇස්තමේන්තු කර තිබුණ ද, සමාලෝචිත වර්ෂය අවසානයට රු. මිලියන 14 ක් රැස්කර තිබූ අතර එය ඇස්තමේන්තුගත ආදායමෙන් සියයට 56 ක් විය. ඒ අනුව අපේක්ෂිත ආදායම් ඉලක්ක ළඟා කර ගැනිමට නොහැකි වී තිබුණි.

(iii) ඉකුත් වර්ෂය සඳහා පත්කරන ලද නොතාරිස්වරුන් 12,243 දෙනකුගෙන් අයකළ ශුද්ධ නොතාරිස් ගාස්තු ආදායම රු.17,585,171 ක් වුවද, සමාලෝචිත වර්ෂය සඳහා පත්කරන ලද නොතාරිස්වරුන් 12,925 ක සංඛ්‍යාවෙන් අයකළ එම අදායම රු.14,438,837 ක් පමණක් වී තිබුණි. මහාධිකරණ කළාප 06 ක ලියාපදිංචි වූ නොතාරිස්වරුන් 322 ක ගෙන් කිසිඳු ආදායමක් අයවී නොතිබුණි.

(iv) මහාධිකරණ 12 කින් නියමිත පරිදි මාසික ආදායම් වාර්තා ගෙන්වා නොගැනීමත් මහාධිකරණ 10 ක වාර්තා අධිකරණ අමාත්‍යාංශ වාර්තා සමඟ සැසඳීමේදී රු.403,737 ක

වෙනසක් පැවතීමත් හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ රැස් කරන ලද රු.14,438,827 ක ආදායමෙහි නිවැරදිතාවය තහවුරු කළ නොහැකි විය.

## 3.5 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය

විෂය අංක 25401 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට සේවකයන් 224 දෙනෙකුගෙන් අයවීම් හිඟහිට තිබුණු ශේෂවල එකතුව රු.4,037,662 ක් වී තිබුණි. එම හිඟහිටි ශේෂ මාස 06 ක සිට වසර 30 ක් දක්වා කාල පරාසයක සිට පැවත එමින් තිබුණි. එම හිඟහිටි ණය ශේෂ අය කර ගැනීමට දෙපාර්තමේන්තුව අපොහොසත්වී තිබුණි.

## 3.6 යහපාලනය හා ගිණුම් කටයුතුභාවය

### 3.6.1 වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම

සමාලෝචිත වර්ෂය සඳහා සවිස්තරාත්මක ප්‍රසම්පාදන සැලැස්ම සහ ප්‍රසම්පාදන කාලසටහන සකස් කර නොතිබුණි.

### 3.6.2 අභ්‍යන්තර විගණනය

ප්‍රධාන අභ්‍යන්තර විගණකයකු පත්කර නොතිබූ අතර අභ්‍යන්තර විගණන අංශයේ තථ්‍ය කාර්ය මණ්ඩලය නිලධාරීන් 04 දෙනෙකුගෙන් යුක්ත විය.

### 3.6.4 විගණන හා කළමනාකරණ කමිටුව

අවම වශයෙන් කාර්තුවකට වරක් විගණන හා කළමනාකරණ කමිටුවේ රැස්වීම් පැවැත්විය යුතු වුවත්, සමාලෝචිත වර්ෂයේදී විගණන හා කළමනාකරණ කමිටුවේ රැස්වීම් වාර 2 ක් පමණක් පවත්වා තිබුණි. එම රැස්වීම් සඳහා ද විගණකාධිපතිවරයාගේ නියෝජිතයකු නිරීක්ෂකයකු වශයෙන් සහභාගී කරගැනීමටත් විගණන වාර්තා සමාලෝචනය කිරීමටත් කටයුතු කර නොතිබුණි.

## 3.7 වත්කම් කළමනාකරණය

දෙපාර්තමේන්තුවේ වත්කම් සම්බන්ධයෙන් සිදුකළ නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

**(අ) වෙනත් ආයතනවලින් ලැබුණු වත්කම් ලේඛනගත නොකර පරිහරණය කිරීම**

රජයේ වෙනත් ආයතන 04 ක් විසින් 2010–2014 කාලපරිච්ඡේදය තුළ දෙපාර්තමේන්තුවට ලබාදී තිබූ වර්ග කිහිපයකට අයත් ස්ථාවර වත්කම් ඒකක 60 ක් තක්සේරු කර වත්කම් ලේඛනයට ඇතුළත් කර නොතිබුණි.

**(ආ) වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ පැවැත්වීම**

දෙපාර්තමේන්තුවේ වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ කටයුතු නියමිත දින වකවාණු වලදී අවසන් කර නොතිබූ අතර, සමීක්ෂණ මණ්ඩල වාර්තාවල ඇතුළත් නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි.

**(ඇ) බේරුම් නොකළ බැරකම්**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) දෙපාර්තමේන්තුව විසින් 2015 දෙසැම්බර් 31 දිනට බේරුම් නොකළ වර්ෂයකට අඩු කාලයක සිට පැවැත එන රු.25,544,674 ක බැරකම් විය. මුදල් වර්ෂය තුළදී ඉදිරිපත් කරන හිමිකම්පෑම් හැකිතාක් දුරට එම මුදල් වර්ෂයේදීම ගෙවා බේරුම් කළ යුතු වුවත්, එම බැරකම්වල ඇතුළත් වටිනාකම රු.5,611,647 ක භාණ්ඩ හා ඊට අදාළ බිල්පත් ආයතනය වෙත ලැබී තිබියදීත්, ඒ සඳහා ගෙවී ම් කර නොතිබුණි.

(ii) සමාලෝචිත වර්ෂය අවසාන වන විට වැය විෂයන් 06 කට අදාළ ඉතිරිය ඉක්මවා රු.3,928,334 ක බැරකම්වලට එළඹ තිබුණි.

## 3.8 අනුකූල නොවීම්

### 3.8.1 නීති,රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති,රීති හා රෙගුලාසිවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| | නීතිරීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| (i) | 1990 ඔක්තෝබර් 10 දිනැති අංක 41/90 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 2.11 ඡේදය | දෙපාර්තමේන්තුව සතු වාහන 21 ක් සම්බන්ධයෙන් මාස 06 කට වරක් ඉන්ධන දහනය පිළිබඳ පරීක්ෂාවක් කර නොතිබුණි. |
| (ii) | 2013 සැප්තැම්බර් 06 දිනැති අංක 162 දරන ජාතික අයවැය චක්‍රලේඛය | සුළු පරිමාණ සැපයුම්කරුවන්ට රු. මිලියන 50 ට අඩු බිල්පත් නිරවුල් කිරීමේදී ඉන්වොයිසිය ඉදිරිපත් කළ දින සිට දින 30 ක් ඇතුළත ගෙවීම් කළ යුතු වුවත්, ඒ අනුව කටයුතු නොකළ අවස්ථා නිරීක්ෂණය විය. |

## 3.9 කාර්යසාධනය

2015 වාර්ෂික අයවැය ඇස්තමේන්තුව හා ක්‍රියාකාරී සැලැස්ම අනුව අමාත්‍යාංශයේ ප්‍රගතිය පිළිබඳ නිරීක්ෂණ පහත දැක්වේ.

**ප්‍රමාණවත් ලෙස ඉටු නොකළ ප්‍රධාන කාර්යයන්**

සමාලෝචිත වර්ෂය සඳහා දෙපාර්තමේන්තුව විසින් පිළියෙල කර තිබුණු ක්‍රියාකාරී සැලැස්ම අනුව කාර්යසාධන වාර්තාව හා සැසඳීමේදී පහත සඳහන් අඩුපාඩු අනාවරණය විය.

(අ) පනත් හා ආඥාපනත් මගින් ඉටුකිරීමට බලාපොරොත්තු වූ ක්‍රියාකාරකම් 11 ක් ඉටුකර ගැනීමට සකස් කරන ලද ක්‍රියාකාරී සැලැස්මෙහි ඇතුළත් කාර්යයන් 04 ක් සඳහා මූල්‍ය හා භෞතික

ඉලක්කයන් සඳහන් කර නොතිබීමෙන් එම කාර්යයන් අපේක්ෂිත ඉලක්කයන්ට ලඟා වූ බව සනාථ කර ගැනීමට නොහැකි විය. විස්තර පහත දැක්වේ.

(i) ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාල ඉදිකිරීම.
(ii) ලී බඩු හා කාර්යාල උපකරණ මිලදී ගැනීම.
(iii) යන්ත්‍රෝපකරණ මිලදී ගැනීම.
(iv) ලිපිද්‍රව්‍ය හා අනෙකුත් අදාළ ද්‍රව්‍ය මිලදී ගැනීම.

(ආ) ක්‍රියාකාරි සැලැස්මෙහි ඇතුළත් කාර්යයන් 03 ක් සම්පූර්ණයෙන්ම ඉටුකර ගැනීමට නොහැකිවී තිබූ අතර එම කාර්යයන්හි මූල්‍ය හා භෞතික ඉලක්කයන් සඳහන් කර නොතිබුණි. විස්තර පහත දැක්වේ.

(i) දිස්ත්‍රික් මට්ටමින් කේන්ද්‍රීය දත්ත ගබඩාවක් ස්ථාපිත කිරීම.
(ii) මධ්‍යම දත්ත ගබඩාවක් ස්ථාපිත කිරීම.
(iii) ප්‍රධාන කාර්යාලයේ ගොඩනැඟිලි ඉදිකිරීම් - 2 වෙනි අදියර

(ඇ) සමාලෝචිත වර්ෂය තුළ ඉඩම් ඔප්පු 100,000 ක් ලියාපදිංචි කිරීමට සැලසුම් කළද ලියාපදිංචි කිරීම සඳහා ලැබුණු ඔප්පු සංඛ්‍යාව 1,100,458 ක් වී තිබුණි. එයින් තථ්‍ය වශයෙන් ඔප්පු 16,190 ක් ලියාපදිංචි කර තිබුණි. ඒ අනුව එහි ප්‍රගතිය සියයට 1.5 ක් වී තිබුණි.

**3.10 අවිධිමත් ගනුදෙනු**

**රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ ක්‍රියා පටිපාටියෙන් බැහැරවීම**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) දෙපාර්තමේන්තුවේ ප්‍රාදේශීය කාර්යාල 20 ක් සඳහා CCTV ආරක්ෂක කැමරා පද්ධති සවිකිරීම සඳහා වූ රු.3,810,100 ක ප්‍රසම්පාදනය සඳහා වූ තාක්ෂණික ඇගයීම් කමිටුවට විෂය පිළිබඳ දැනුමක් ඇති සාමාජිකයකු ඇතුළත් කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ ප්‍රසම්පාදන සැලැස්මට අනුව පරිගණක මිලදී ගැනීම සඳහා රු.5,000,000 ක ප්‍රතිපාදන සලසා තිබුණත්, සීමාව ඉක්මවා රු.12,185,200 ක් වැය කර පරිගණක මිලදී ගෙන තිබුණි.

**3.11 කළමනාකරණ දුර්වලතා**

නියැදි විගණන පරීක්ෂණවලදී පහත සඳහන් දුර්වලතා නිරීක්ෂණය විය.

(අ) 2010 වර්ෂයේදී ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ නියෝජිතායතනයේ උපදේශකත්වය මත රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව විසින් ප්‍රාදේශීය ලේකම් කාර්යාල මට්ටමින් උපත් හා මරණ ලියාපදිංචි විස්තර දත්ත පද්ධතියට ඇතුළත් කිරීම සඳහා පරිගණක වැඩසටහන් ස්ථාපිත කර තිබුණි. නමුත් යාපනය, කිලිනොච්චිය හා මුලතිව් යන දිස්ත්‍රික්කවලත් සමහර ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලත් එය ක්‍රියාත්මක කර නොතිබුණි.

(ආ) හෝමාගම ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ විධිහීනතා වාර්තා සම්බන්ධයෙන් රෙජිස්ට්‍රාර් ජනරාල්ගේ අත්පොත සමඟ පරික්ෂා කිරීමේ දී පහත සඳහන් කරුණු නිරික්ෂණය විය.

(i) ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාල විසින් සකස් කරන ලද විධිහීනතා වාර්තා අප්‍රමාදීව මාසයකට ප්‍රථම රෙජිස්ට්‍රාර් ජනරාල් වෙත යොමු කළයුතු වුවත් නොතාරිස්වරුන් දසදෙනෙකුට අදාළ වාර්තා ඉදිරිපත් කිරීමට වසර 03 සිට වසර 11 ක් දක්වා කාලයක් ගතවී තිබුණි.

(ii) නොතාරිස්වරුන් විසින් දිස්ත්‍රික් ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාල වෙත සති ලැයිස්තු කිසිවක් ඉදිරිපත් කර නොතිබූ අතර එම කාර්යාල විසින් සති ලැයිස්තු පිළිබඳ විස්තර සටහන් කිරීමේ රෙජිස්ටරද පවත්වා නොතිබුණි.

(ඇ) විවාහ උප්පැන්න සහ මරණ සහතිකවල දෙවන පිටපත් සංරක්ෂණය කිරීමේ අරමුණින් පවත්වාගෙන යනු ලබන මාලිගාවත්ත ලේඛනාගාර ගොඩනැඟිල්ල හා හෝමාගම ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ ලේඛනාගාරය, එහි ලිපිගොණු සහ ලේඛන ආරක්ෂා කිරීමේ හා නඩත්තු කිරීමේ ක්‍රමවේදයක් අනුගමනය කර නොතිබුණි.

(ඉ) මධ්‍යම ලේඛනාගාරය සඳහා පෞද්ගලික ආයතනයකින් ඡායා පිටපත් සේවයක් ලබා ගෙන ඒ සඳහා ආයතනය තුළ ලේඛන නඩත්තු නොකර එම ආයතනයේ තොරතුරු මත 2012 ජනවාරි 01 දින සිට 2015 ජුනි මාසය දක්වා කාලය තුළ රුපියල් 2,394,459 ක් ගෙවීම් කර තිබුණි. එයින් වැඩි ඡායා පිටපත් ප්‍රමාණයක් මාණ්ඩලික නිලධාරියෙකුගේ අනුමැතියකින් තොරව ලබාගත් කාර්යාල ලිපි පිටපත් බවට නිරීක්ෂණය වූ අතර එම ලිපි මොනවාද යන්න හඳුනාගත නොහැකිවීමෙන් ලේඛනවල ආරක්ෂාව ගැටළුකාරීවී තිබුණි.

**3.14 මානව සම්පත් කළමනාකරණය**

**අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

2015 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව | අතිරික්ත සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 43 | 08 | 35 | - |
| (ii) | තෘතියික මට්ටම | 49 | 52 | 04 | 07 |
| (iii) | ද්විතියික මට්ටම | 1,897 | 1,570 | 327 | - |
| (iv) | ප්‍රාථමික මට්ටම | 673 | 600 | 73 | - |
| (v) | වෙනත් (කොන්ත්‍රාත් පදනම) | - | 01 | - | 01 |
| | **එකතුව** | **2,662** | **2,231** | **439** | **08** |

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.
ඉඩම් රෙජිස්ට්‍රාර් / හිමිකම් රෙජිස්ට්‍රාර්වරුන්ගේ තනතුරෙහි අනුමත කාර්ය මණ්ඩලය ඉක්මවා 07 දෙනෙකු බඳවාගෙන තිබුණත්, ඒ සඳහා විධිමත් අනුමැතියක් ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි.